**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 15 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.619,950 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම් මුදල රු.353,322 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.120,506 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පොදු තැන්පත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.1,630,318 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ විවිධ ණයහිමි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.113,733 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල රු.1,517,341 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් ශේෂ එකතුව මුළු හිමිකම් හා වගකීම් ශේෂ එකතුව සමඟ රු.4,009,842 කින් නොසැසඳුනි.

(ඌ) ඉකුත් වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ ලෙජරයට පිටපත් කිරීමේ දී රු.1,561,022 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂය, මූල්‍ය ප්‍රකාශනවල රු.4,509,807 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 8,095,960 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර දක්නට ලැබුණු වෙනස්කම්වල එකතුව රු.1,945,301 ක් විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,729,000 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,849,511 ක් විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 396(ඇ) | වටිනාකම රු.10,200 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු. රෙ. 571 | වටිනාකම රු.25,868 ක් වූ කල් ඉකුත්වන ලද තැන්පත් ශේෂ 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ සේවකයින් 09 දෙනෙකුගෙන් වර්ෂ 5 සිට 27 දක්වා කාලයක සිට අය නොවූ ණය ශේෂ රු.33,548 ක් විය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,130,177 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,356,498 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.600,242 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.849,302 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභාවට අයත් කඩ කාමර 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා 2014 සැප්තැම්බර් මස කඩහිමියන්ගෙන් සභාවට පවරාගෙන තිබූ නමුත්, 2016 අගෝස්තු 05 දින වන විටත් ඒවා අලුත්වැඩියා කර නැවත කඩහිමියන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) 2014 වර්ෂයේදී ඉදිකිරීම් සඳහා ලබාදී තිබූ රු.482,258 ක අත්තිකාරම් පියවාගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා සුසාන භූමි වටා කම්බි වැටක් ඉදිකිරීම වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු.194,700 ක් වූ කම්බි කණු හා කටු කම්බි ඉඩම් පවරාගැනීම හෝ මායිම් හඳුනාගැනීම සිදුකර නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු 30 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

3.3 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකර එක්රැස් කරනු ලබන කසල ආඩාඋල්පත පොල භූමියට අක්‍රමවත්ව බැහැර කර තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ ඡේද 4:2 අනුව සෑම ආයතනයක්ම වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාව ප්‍රවර්තන වර්ෂයේ දී එසේ කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) වාහන පාලනය
(ඉ) ගබඩා පාලනය
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) ණයහිමි පාලනය